# අනුසය ධර්ම පිළිබඳ විවරණයක්

පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ කථිකාචාර්ය
ආචාර්ය යටගම ධම්මපාල ස්ථවිර

අනුසය යන්න පාළි අට්ඨකථාවන්හි "අනුසෙන්තීති අනුසය" යනුවෙන් නිර්වචනය කෙරෙන්නේ යටපත්ව, නිද්‍රොපගත ස්වභාවයෙන් පවත්නා කෙලෙස් හැඳින්වීම සඳහාය. විසුද්ධි මග්ගයේ ඤාණදස්සන විසුද්ධි නිද්දේසයේත්[1] සුත්තනිපාත අට්ඨකථාවේත්[2] මේ පිළිබඳ විවරණ ඉදිරිපත් කරන බුද්ධඝෝෂ හිමියෝ දෘඩිව පිහිටි බව, නැවත, නැවත ඉපදීමට හේතුවන බව, ප්‍රහීන නොකළ බව ආදි අතිරේක අර්ථ කීපයක් ද මෙයට එක් කරමින් පුද්ගල සන්තානයෙහි යටපත්ව සිටින ආකාරය පෙන්වා දෙති. සත්වයාගේ සංසාරික පැවැත්මෙහි මූල අනුසය වශයෙන් අභිධර්මකෝශ කරුවෝ දක්වති.[3] මේ ලක්ෂණ දරන අනුශය ධර්ම සතක් දීඝනිකායේ සංගීති හා දසුත්තර සූත්‍රයන්හි ද, අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ ද දක්නට ලැබේ. ඒවානම්: කාමරාග, පටිඝ, දිට්ඨි, විචිකිච්ඡා, මාන, භවරාග හා අවිජ්ජා යන සතයි.

මේ නාමලේඛනයන් හැරුණුවිට වෙනත් පාඨ සම්බන්ධයන්හිදී අනුසය යන වචනය නිකාය සාහිත්‍යයෙහි යෙදී ඇති ආකාරය පිරික්සා බැලීම මෙහිදී ප්‍රයෝජනවත් වේ. අනුශය පිළිබඳ අගනා විවරණයක් දක්නට ලැබෙන්නේ මජ්ඣිමනිකායේ මහාමාලුංක්‍ය සූත්‍රයේය.[4] තමන් ඕරම්භාගිය සංයෝජනයන් හඳුරා තිබෙන්නේ කෙසේදැයි වරෙක මාලුංක්‍යපුත්ත හිමිගෙන් බුදුරජාණන් වහන්සේ විමසූ කල්හි එයට පිළිතුරු දෙන්නේ සක්කායදිට්ඨි, විචිකිච්ඡා ආදී සංයෝජන ධර්ම පසෙහි නම් දැක්වීමෙනි. මෙය බුදුන්වහන්සේගේ දෝෂ දර්ශනයට ලක් වෙයි. කිරිකැටි දරුවන් පිළිබඳව සඳහන් කිරීමේදී මේ නම් ඉදිරිපත් කිරීම අන්තොවුවන්ගේ සිනහවට ලක් වන්නකැයි ප්‍රකාශ කරන බුදුන් වහන්සේ සත්කාය යන හැඟීමකුදු නැති දරුවාට සත්කායදෘෂ්ටියක් ඇතිවන්නේ කෙසේදැයි ප්‍රශ්න කරති. මෙහිදී බුදුන් වහන්සේ දක්වන්නේ එම ධර්මයන්ට "අනුසය" ශබ්දය ද එක් කිරීමෙනි. එනම් සක්කායදිට්ඨානුසය ආදි වශයෙනි. දැඩි, ශක්තිමත් මුල් නොසිඳි ගසක් මෙන් දුක ද තණ්හා - අනුසය නොසිඳි කල්හි නැවත නැවත උපදින බව ධම්මපදයෙහි[5] සඳහන් වේ. මෙහි දැඩිව පිහිටි මූල තණ්හා අනුසයයි. බුදුන් වහන්සේගේ උපකාරය නිසා දීඝරත්ත-අනුසයිත (බොහෝ කලක් යහපත්ව පැවති) කිලේස ග්‍රන්ථයන් සිය මනසින් ඉවත් කර ගත් බව තේලකානි හිමියෝ[6] ප්‍රකාශ කරති. මේ ආදි නිදසුන් සමග "අනුසය" ශබ්දය උපයුක්ත වූ වෙනත් තැන් ද සලකා බැලීමේදී සංඛ්‍යාත්මක වර්ග කිරීම් සකස් වීමට පෙර එය කිලෙස, සංයෝජන, ගන්ථ ආදී කවර හෝ නමකින් පුද්ගල සන්තානයෙහි මුල්බැස ගත් අකුසල ධර්ම නිරූපනය කිරීම සඳහා යෙදී ඇති බව නිගමනය කළ හැකිය.

මහා මාලුංක්‍ය සූත්‍රය දෙස නැවත වරක් බැලීමේදී පුථුජ්ජන හා අරියසාවක යන දෙදෙනාගේ විශේෂ ලක්ෂණ හැඳින්වීමක්[7] දක්නට හැකි වෙයි. පෘථග්ජනයා සත්කායදෘෂ්ටිය නැග එන සිතින් (පරියුට්ඨිතෙන චෙතසා) එය කෙරෙහි නැඹුරු වූ සිතින් වසයි. ඔහුගේ සත්කායදෘෂ්ටිය දෘඪව (ථාමගත) ඉවත් නොකරන ලදුව ඇත්තේ නම් ඒ ඕරම්භාගිය සංයෝජනයයි. ආර්ය ශ්‍රාවකයා එබඳු තත්වයකින් නො වසයි. හෙතෙම උපන් සත්කාය දෘෂ්ටිය ඉවත් කරන අයුරු දනී. එහෙයින් සත්කාය දෘෂ්ටිය අනුශය සහිතවම ඔහුගේ මනසින් ඉවත්ව යයි. මේ විවරණයෙන් ථාමගත ඕරම්භාගිය සංයෝජනය වශයෙන් හැඳින්වෙන්නේ එම ක්ලෙශයෙහි අනුශය අවස්ථාවම බව පෙනේ. ආර්ය ශ්‍රාවකයාට යථාභූත ඥානදර්ශන ප්‍රතිලාභයෙන් එම සංයෝජනය ප්‍රහීනවනුයේ මතුපිටින් (පරියුට්ඨිත) පමණක් නොව අනුසය අවස්ථාව ද සහිතවය. (සානුසයො පහීයති)

ක්ලේශධර්මයන්ගේ අනුසය අවස්ථාව පිළිබඳ යථාවබෝධය ලබාගැනීම බෞද්ධ දර්ශනයෙහිදී ඉතා ශ්‍රේෂ්ඨ වශයෙන් සැලකේ. ආර්ය ශ්‍රාවක භික්ෂු යන නාමය අර්ථවත් වන්නේ අනුශය රහිතවූවිටදීය. අකුශලමූලයන් විනාශකළ කල්හිය.[8] බුදුන්වහන්සේ පවා සසරකතරින් එතරවූයේ අනුශය සිඳීමෙනි.[9] ලෝභාදි කවර හෝ අකුශල මූලයකට සබඳකම් දැක්විය හැකි කිසිවක් විද්‍යාමාන වනතුරු පූර්ණ විමුක්තිය ලද අයකු ලෙස නොගැනේ. සංයුත්ත නිකායේ එන ඛෙමක හිමියන්ගේ පුවත[10] මෙයට නිදසුනකි. පඤ්චඕරම්භාගිය සංයෝජනයන් ප්‍රහීන කළද ලෝභාදීයෙහි ඡායාව ගත් උණුසුමක් විනාශ නොවී සැඟවී පවත්නා බවක් (පඤ්චසුපාදානක්ඛන්ධෙසු අනුසහගතො අස්මීති මානො අස්මීති ඡන්දෙ අස්මීති අනුසයො අසමූහතො) එහිදී දක්නට හැකි වෙයි. රෙදි සෝදන්නා විසින් ගොම මැටි සෝඩා ආදිය දමා කිළුටු රෙද්දෙහි කසට ඉවත්කර පිරිසිදු වතුරෙන් සෝද දුන්නත් ගොම සෝඩා ආදියේ රළු

උෂ්ණය හැරීමට නම් රෙදි හිමියා එය සුවඳ ද්‍රව්‍ය දැමූ පෙට්ටියක අල්මාරියක තැන්පත් කර තැබිය යුතුය. ගොම ආදියෙන් සැදෙන ක්ෂාර ගන්ධය මෙහිදී ''අස්මි'' යන අනුසයට උපමා කොට එය අවබෝධ කර ගැනීම නිසාම ඛෙමක හිමියන් අර්හත්වය ලද බව එහි සඳහන් වෙයි.

අනුශය ධර්ම හඳුන්වා දෙන පටිසම්භිදමග්ගය[11] එකම සිතක අනුසයයන් කීපයක් ලැග සිටින අයුරු පෙන්වා දෙයි. ප්‍රිය ස්වභාවය ඇති තැන කාමරාගානුසය ලැග සිටී; අප්‍රිය ස්වභාවය ඇති තැන පටිඝානුසය ලැග සිටී; මේ දෙකෙහිම අවිද්‍යාවද සම්බන්ධ වී ඇත; අවිද්‍යාව සමග මාන දිට්ඨි හා විචිකිච්ඡාවද පවතී. අනුශය ධර්ම පිළිබඳ දීර්ඝ විවරණයක් දක්නට ලැබෙන්නේ අභිධර්ම පිටකයට අයත් යමකප්පකරණයේය.[12] කාමරාගානුසය ඇති තැන පටිඝානුසයත් ඇද්දැයි ප්‍රතිවාදියා කරන විමසීමට ''එසේය'' යි යමකයේදී[13] පිළිතුරු ලැබේ. මේ පිළිතුර පටිසම්භිද මග්ගයේ විස්තරය සමග ද ගැලපෙයි. එහෙත් අට්ඨකථා කරු එය හුදෙක් ව්‍යවහාරයට අනුගත වීමක් විනා යථාර්ථ නිරූපනයක් නොවන බව පෙන්වා දෙයි.[14] පිටකාගත ප්‍රකාශනය නිවැරදි කිරීම සඳහා උපමාවක් දක්වන අට්ඨකථා කරු ''යම් කර්මාන්තයක නියැලී එහෙත් එය නො නිමවූ වඩුවකු හෝ සිත්තරකුගෙන් මේ දිනවල කුමක් කරන්නේදැයි විමසූවිට ඒ මොහොතේ එම වැඩය නොකළත් අසවල් වැඩය කරමි''යි පිළිතුරු දීම හා සමාන යයි කියයි. නිකාය සාහිත්‍යය තුළ දක්නට ලැබුණු සිත පිළිබඳ විවරණයත් පශ්චාත්කාලීන විවිධ ආචාර්යවාදයන් තුළ ඉතා සියුම්ව විග්‍රහයන්ට භාජනය වීම අට්ඨකථාවෙහි ආ එම ප්‍රකාශයට පසුබිම් වන්නට ඇතැයි සිතිය හැකිය.

කාමරාගාදීන්ගේ අවස්ථා තුනක් විද්‍යමාන වේ. එනම්: වීතික්කම, පරියුට්ඨාන හා අනුසය යනුවෙනි. කාමරාගාදීන් ක්‍රියාත්මක වන අවස්ථාව හෙවත් අකුසල් සිදුවෙන අවස්ථාව වීතික්කම නමි. උචිත අරමුණක් ඇති කල්හි කාමරාගාදිය නැග ඒම පරියුට්ඨාන නමි. එබඳු උචිත අරමුණක් නැතිවිට පුද්ගල සන්තානයෙහි යටපත්වී නිද්‍රොපගත ස්වභාවයෙන් පවත්නේ අනුසයයි.[15] ආර්ය මාර්ගයෙහි ඉදිරියට යෑමේදී අභිමුඛව එන මේ අවස්ථාවන්ගෙන් වීතික්කමය සීලයෙන් ද, පරියුට්ඨානය සමාධියෙන් ද, අනුසය පඤ්ඤාවෙන් ද වලක්වා ගන්නා අයුරු බුද්ධඝෝස හිමියෝ පෙන්වා දෙති.[16] මේ අනුව ක්ලේශයන්ගේ බලවත්ම අවස්ථාව අනුසය බවත්, එයට මුහුණ දිය හැක්කේ හුදු ප්‍රඥාවට පමණක් බවත් සිතිය හැකියි. සොතාපත්ති මග්ගයෙහිදී අනුසය සතෙන් දිට්ඨි විචිකිච්ඡා යන දෙක ප්‍රහීන වෙයි. සකදගාමී පුද්ගලයා අනුසය ප්‍රහාණය සඳහා ඉන් ඉදිරියට යාමක් දක්නට නොලැබේ. අනාගාමී මාර්ග ලාභියා කාමරාග හා පටිඝ ප්‍රහාණය කොට ඇති අතර ඉතිරි වූ මාන, භවරාග, අවිජ්ජා යන අනුශය ධර්මයන් ප්‍රහාණය කෙරෙනුයේ අර්හත් මාර්ගයෙනි.

කාලයාගේ ඇවෑමෙන් ථෙරවාදය තුළ මෙන්ම වෙනත් ආචාර්යවාදයන් තුළ ද අනුශය ධර්ම පිළිබඳ විග්‍රහයන් විකාශයට පත්වී ඇති අයුරු දක්නට ලැබේ. පුද්ගල සන්තානයෙහි ථාමගතව යටපත්ව ඇති ක්ලේශයන් සඳහා අනුශය නාමය යෙදී ඇතැයි ගත හොත් පරියුට්ඨාන යනු එම ක්ලේශයන්ගේ නැගී සිටීමේ අවස්ථාව බව පෙළ දහම අනුව නිගමනය කළ හැකිය. විභංගප්පකරණය[17] එයට අනුරූපව ම පරියුට්ඨාන ධම්ම යතක් නම් වශයෙන් දක්වා ඇත. යෝගාචාරික හා පශ්චාත් කාලීන වෛභාෂික කෘති වල මෙයට වෙනස් පර්යවස්ථාන නාම මාලාවක් ඉදිරිපත් කොට ඇත. යෝගාචාරිකයො[19] ස්ත්‍යාන, මිද්ධ, ඖද්ධත්‍ය, කෞකෘත්‍ය, ඊර්ෂ්‍යා, මාත්සර්යය, අහ්‍රිකු හා අනපත්‍රාප්‍ය යනුවෙන් පර්යවස්ථාන අටක් නම් කෙරෙන අතර, වෛභාෂික කෘතියක් වන අභිධර්මදීප විභාෂාප්‍රභා වෘත්තියෙහි[19] ම්‍රක්ෂ හා ක්‍රොධ යන නම් දෙකද ඉහත ලේඛනයට අන්තර්ගතව පර්යවස්ථාන දසයක් දක්වා ඇත. එහෙත් වෘත්තිකරු වෙනත් තැන්වලදී[20] අනුශය හා පර්යවස්ථාන ක්ලේසයන්ගේ අවස්ථා දෙකක් ලෙස පිළිගෙන ඇත. ථෙරවාදීන් ඉහත සඳහන් අන්‍ය නිකායික නාමමාලා ප්‍රතික්ෂේප කරමින් අනුසය - පරියුට්ඨාන අවස්ථාන්තරයන් පමණක් බව දක්වනු කථාවත්ථුප්පකරණයේ දී දක්නට ලැබේ.[21]

සූත්‍රාන්ත දේශනාවන් බොහෝදුරට සකස්ව ඇත්තේ ලෝක ව්‍යවහාරයට අනුගතව විනා පරමාර්ථ ධර්ම ඉතා සියුම්ව බෙද දැක්වීම සඳහා නොවේ. එහෙත් බෞද්ධ ආචාර්යවාදයන් ගොඩ නැගෙන්නේ ධර්මය පිළිබඳ සියුම් විග්‍රහයන් පසු තලය කොට ගෙනය. අනුශය-පරිසුට්ඨාන පිළිබඳව ඉහත දැක්වූ මතවාදයන්ට අමතරව ඒවායේ පැවැත්ම ආදිය පිළිබඳවද විවිධ විග්‍රහයන් එක් එක් නිකායිකයන් විසින් ඉදිරිපත් කොට ඇත. මහා මාලුංක්‍ය සූත්‍රයෙහි ආ පරිදි සෑමවිටම පෘථග්ජන මනසෙහි අනුසය - පරියුට්ඨාන යන කවර ආකාරයකින් හෝ කෙලෙස් පවත්නේ වී නම් සෑම විටම සිතක් අකුසල සහගත වේ. අනුශය යනු අකුසල ධර්ම හෙයින් ඒවා පවත්නා තුරු කුසල් සිත් ඇතිවීමට ඉඩක් තිබේද යනු ගැටළුවකි. එසේම කුශල චිත්තයක් ඇති නොවී අකුශල ප්‍රහාණය කිරීමට ඉඩක්ද ඇතිවිය නො හැකිය. ආභිධර්මික යුගයේදී සිතෙහි ක්‍රියාකාරිත්වය විභජනය කොට දැක්වීමත්, අනිත්‍යාදී ලක්ෂණයන් හා කර්ම සිද්ධාන්තය වැනි ඉගැන්වීම් විවරණය කිරීමත් අත්‍යවශ්‍ය වූයෙන් එහි ප්‍රධාන ස්ථානයක් ගන්නා අනුශය පිළිබඳව මෙබඳු විචාරයන්ට පිළිතුරු සැපයීමට ඒ ඒ ආචාර්යවාදයන්ට සිදුවී ඇත.

''සානුසයො පහීයති'' යන සූත්‍රයෙහි ආ පාඨයෙන් ''අනුසය සහිතව ප්‍රහීන වේ'' යයි කීමෙන් අනුසය රහිතව පරියුට්ඨානයෙහි ප්‍රහීනයක් ද තිබිය හැකි බවක් ගම්‍ය වේ. සක්කායදිට්ඨි පරියුට්ඨිත අවස්ථාව සංයෝජනයයි ගතහොත් අනුසය රහිතව සංයෝජනයේ ප්‍රහාණයක් ද අනුමාන කළ හැකි වෙයි.

සූත්‍රයෙහිදී බුදුන් වහන්සේ පරියුට්ඨාන හෙවත් සංයෝජන නාමය පමණක් දැක්වීමට විරෝධය දක්වා අනුසය යන්නක් එකතු කොට එය නිවරද කරන ලද්දේ පරියුට්ඨාන හා අනුසය දෙකක් වශයෙන් ගත යුතු හෙයින් ද? යන පැණයකුදු නැඟීමට ඉඩ ඇත.

වාත්සීපුත්‍රීයයෝ[22] අනුශය පර්යවස්ථානයෙන් වෙන්කොට චිත්තවිප්‍රයුක්ත ධර්ම ලෙස ගනිති. චිත්තවිප්‍රයුක්ත හෙයින් කුශල ධර්මයන් හා එක්ව පැවැත්මට බාධාවක් නොවේ. පර්යවස්ථානය වනාහි චිත්ත සම්ප්‍රයුක්තය. එහෙයින් එම අවස්ථාවේදී කුසල් හා අකුසල් වෙන් වෙන්ව ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. අනුශය ධර්ම වෛභාෂික චිත්ත—විප්‍රයුක්ත—සංස්කාර ලේඛනයෙහි එන ප්‍රාප්ති යන්නෙහි ඇතුළත් කොට වාත්සීපුත්‍රයන් විසින් හඳුන්වනු ලැබේ.

වෛභාෂිකයා රාගානුශය යන්න කර්මධාරය සමාස පදයක් ලෙස (රාග එව අනුශයඃ) දක්වයි.[23] ''සානුශය'' යන්න සානුබන්ධ'' යන පර්යාය වචන-යකින් හඳුන්වා දෙමින් ''එහි අලුත් ක්ලේශ ධර්මයක් නිපදවීමට ඇති ශක්තිය'' සමග යනුවෙන් අර්ථ නිරූපනය කරයි. මේ පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කරන වෘත්තිකරු සූත්‍රයේදී අනුශය ශබ්දය ප්‍රාප්ති සංස්කාරය සමග එකත්වයක් දරන්නේ උපචාර වශයෙන් බවත්, අභිධර්මය ක්ලේශයම (පර්යවස්ථා-නය) අනුසය යයි ඍජුවට ප්‍රකාශ කරන බවත් සඳහන් කරයි.[24]

ථෙරවාදීහුද පරියුට්ඨානය අනුසය සමග එකත්වයෙන් හඳුනා ගනිති. මහා මාලුංක්‍ය සූත්‍රයෙහි අදාළ පාඨය විවරණය කරන බුද්ධඝෝස හිමි[25] හිස වසා නිද සිටින පුරුෂයකුගේ උපමාවක් ගෙන හැර දක්වා මිනිසා හිසෙන් වෙන්කොට හඳුනා ගැනීමේ සාවද්‍යතාව පෙන්වා දෙයි. සූත්‍රපාඨයන් ගෙන් යම් විරුද්ධාර්ථයක් උපකල්පනය කළහැකි වුවද එය විවේචනයෙන් තොරව හඳුන්වා දෙමින් එකම ක්ලේශය (සො යෙව කිලෙසො) බැඳීම් අර්ථ-යෙන් සංයෝජන යයි ද අප්‍රහීන අර්ථයෙන් අනුසය යයි ද ප්‍රකාශ කිරීම සඳහා බුදුන් වහන්සේ විසින් ''සානුසයො පහීයති'' යන වැකිය යොදන ලදැයි කියමින් සිය අදහසම නැවතත් ස්ථිර කොට දක්වයි.

කථාවත්ථුවෙහිදී අනුසය පිළිබඳව එකල පැවති මතභෙද කීපයක් උපුටා දැක්වේ. එම මත එක් එක් ආචාර්යවාදයන් වෙත ආරෝපනය කරන්නේ අට්ඨකථාවයි. අනුසයයන් චිත්ත විප්පයුත්තය, අහේතුකය, අබ්‍යාකතයයි කථාවත්ථුව උපුටා දක්වා ඇති මතය අන්ධක හා උත්තරාපථ කොටසක යැයි අට්ඨකථාව[26] කියයි. අභිධර්මදීප වෘත්තියෙන් ගෙන ඉහත දක්වන ලද වාත්සීපුත්‍රීය මතය මෙයට සමාන බව පෙනේ. යමක අට්ඨකථාවේදී තවදුරටත් මේ පිළිබඳව විවරණය කරන බුදුගොස් හිමි කෙලෙස් සඳහා අනුසය යන නම දී ඇත්තේ ඒවා දැඩිව පිහිටි නිසාත්, අනුරූප කාරණයක් ලබාගෙනම උපදින නිසා බවත්[27] පෙන්වා දෙයි.

සෞත්‍රාන්තිකයා ද ස්වකීය සිද්ධාන්තයන්ට අනුරූප ආකාරයෙන් අනුසය ධර්මයන් විවරණට කරමින් සූත්‍රානුසාරයෙන් අර්ථ නිරූපනය කෙරෙයි. අභිධර්මදීප වෘත්ති කතුවරයා[28] සෞත්‍රාන්තික දර්ෂ්-ටාන්තික මතය ගැන සඳහන් කරමින් දර්ෂ්ටාන්තිකයා ''කාමරාගයාගේ අනුශය'' කාමරාගානුශය යයි (ෂෂ්ටී තත්පුරුෂ සමාසයෙන්) දක්වන බවත්, ද්‍රව්‍ය විශේෂයක් නොවන හෙයින් සම්ප්‍රයුක්ත හෝ විප්‍රයුක්ත යැයි නො කියන බවත් ප්‍රකාශ කරයි. ක්ලේශය යටපත්වූ අවස්ථාවේ අනුශය නමින් ද, ප්‍රබුද්ධ අවස්ථාවේ පර්‍යවස්ථාන නමින් ද හැඳින්වෙන බව සෞත්‍රාන්තිකයා ද පිළිගනී. යටපත් වූ විට එය අනාරම්මණ වුවද බීජ ලක්ෂණයෙන් යුක්තව පවතී. මේ බීජ ලක්ෂණය අතීත ක්ලේශයන්ගෙන් ජනිත වූ අලුත් ක්ලේශයන් ඉපදවීම සඳහා සිතෙහි නෛසර්-ගිකව පවත්නා ශක්තියකි. යශෝමිත්‍රයෝ[29] මෙම ශක්තිය වී ඇටයකින් හටගත් ගොයම් පැලයක ඇති නැවතත් වී බිහිකිරීමේ ශක්තිය හා තුලනය කොට දක්වති.

බීජ සිද්ධාන්තය විවරණය කරන යශෝමිත්‍ර[30] කුශල - අකුශල, සාශ්‍රව - ආනාශ්‍රව වශයෙන් පැනෙන සියුම් බීජයන්ට එක්ව සිටිය හැකි බව පෙන්වා දෙයි. එහෙත් ඒවා චිත්තසම්ප්‍රයුක්ත ද නොවේ; විප්‍රයුක්තද නොවේ; ද්‍රව්‍යත්වයෙන් තොර හුදු ප්‍රඥප්ති පමණෙකි. එක්වරෙක ක්‍රියාත්මක වනුයේ එක් වර්ගයෙක බීජයක් පමණි. අනුශය බීජයක් ක්‍රියාත්මක වන විට හෙවත් පර්යවස්ථාන ස්වභාවයට පත්වන කල්හි සිත අකුශල සිතක් වශයෙන් ද, කුශල ධර්ම බීජයක් පර්යවස්ථාන වන කල්හි කුශල චිත්තයක් වශයෙන් ද නම් කෙරේ. ආචාර්යවාදයන්ගේ ඉතිහාසය ගැන සලකා බැලීමේදී මෙම සෞත්‍රාන්තික බීජ (කෝෂ්ටාගාර) සිද්ධාන්තය විඥානවාදීන්ගේ විපාක (ආලය) විඥන[31] සිද්ධාන්ත-යට මුල්වන්නට ඇතැයි සිතිය හැකිය.

බුදුසමය තුළ විවිධ ආචාර්යවාදයන් ඇති වූයේ මූලික සූත්‍ර දේශනයන්හි ලොක ව්‍යවහාරයට අනුරූපව ඉදිරිපත් කොට ඇති දේශනා පාඨයන්හි එන ඇතැම් තැන් ඉතා සියුම්ව විවරණය කිරීමට යාමේ ප්‍රතිඵලයක් වශයෙන් බව සිතීමට බොහෝ දුරට හේතු සාධක තිබේ. අනුශය ධර්ම පිළිබඳ විවිධ මතයන් සඳහා මුල්වී ඇත්තේ මහා මාලුංක්‍ය සූත්‍රයේ එන ඇතැම් විවරණ බව ඉහත සඳහන් විග්‍රහයන් අනුව සිතිය හැකිය. එහෙත් මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තක් නම් සෑම ආචාර්ය වාදයක්ම පාහේ සූත්‍ර දේශනාවන් ගෞරවයෙන් යුක්තව සඳහන් කරන අතර ඇතැම් ගැටළු සහිත ප්‍රකාශනයන්හි නියම අර්ථය වටහා ගත යුත්තේ කවර අංශයකින්දැයි පැහැදිලි කිරීමට උත්සාහ දරන බවය.

# සටහන්

1. විසුද්ධිමග්ග, සද්ධාතිස්ස සංස්කරණය, 510 පිට
2. සුත්තනිපාත අට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, 15 පිට
3. අභිධර්ම කොශ, v. 1
4. මජ්ඣිමනිකාය, පාළි පොත් සමාගම, 1 . 433
5. ධම්මපද 336 ගාථාව
6. ථෙරගථා. 768 (තෙලකානිථෙරගාථා)
7. මජ්ඣිමනිකාය, 1 . 433 – 434
8. සුත්තනිපාත, 14 ගාථාව
   යස්සානුසයා න සන්ති කෙචි මූලා අකුසලා සමූහතාසෙ
9. සුත්තනිපාත, 545 ගාථාව, සභියසුත්ත
   තුවං අනුසයෙ ඡෙත්වා තිණ්ණො තාරෙසි මං පජං
10. සංයුත්තනිකාය (පා. පො. ස.) III. 130-131
11. පටිසම්භිදාමග්ග, බුද්ධජයන්ති මුද්‍රණය) 1 . 232
12. යමකප්පකරණය
    (කි. ඤාණවිමල සංස්කරණය) 245 = 428 පිටු
13. ''යස්ස කාමරාගානුසයො අනුසෙති, තස්ස පටිඝානුසයො අනුසෙතීති? ආමන්තා, යස්සවා පටිඝානුසයො අනුසෙති, තස්ස කාමරාගානුසයො අනුසෙති ති ආමන්තා,'' යමක, 245 පිට
14. ''එත්ථ යදෙතං 'ආමන්තා'ති පටිවචනං දින්නං, තං දුද්දින්නං පියබායති'' පට්ඨානප්පකරණට්ඨ කථා (හේ. මු.) 243 පිට
15. බලන්න: රේරුකානේ චන්දවිමල නාහිමි, අභිධර්ම මාර්ගය, 257 – 8 පිටුව
16. විසුද්ධිමග්ග, 4 පිට
17. විභංගප්පකරණය, (ඤාණවිමල සං) 283 පිට
18. අසංග, අභිධර්මසමුච්චය, (Asm) 47 පිට
19. අභිධර්මදීප (පී. එස්. ජෛනි සංස්කරණය)
    373 කාරිකාවට ලියා ඇති වෘත්තිය.
20. අභිධර්මදීප, 261 වැනි කාරිකාවෙ වෘත්තිය.
21. කථාවත්ථු (කි. ඤාණවිමල සං) අසොකං අනුසයාති කථා, XIV 5.
22. අභිධර්මදීප, 261 කාරිකාව යටතේ ඇති වෘත්තිය බලන්න.
23. එම ''කර්මධාරය එව පරිගෘහ්‍යතෙ, නෂෂ්ඨීසමාස ඉති වෛභාෂිකාඃ''.
24. එම ''ඖපචාරිකො වා සූත්‍රෙ 'නුශය ශබ්දඃ ප්‍රාප්තෙ ... ලාක්ෂණිකස් ත්ව'භිධර්මෙ ක්ලේශ එවානුශයඃ''.
25. මජ්ඣිමනිකායට්ඨකථා, (පා. පො. ස.) III, 144 පිට
26. පට්ඨානප්පකරණට්ඨකථා (හේ. මු.) 166 පිට
27. පට්ඨානප්පකරණට්ඨකථා (හේ. මු.) 239 පිට;
    විසුද්ධිමග්ග, 510 පිටද බලන්න.
28. අභිධර්මදීප වෘත්ති, 222 පිට
29. යශොමිත්‍ර, ස්ඵුටාර්ථාභිධර්මකොශව්‍යාඛ්‍යා, 147 – 148 පිටු
30. යශොමිත්‍ර. එම 444 පිට
31. කියවන්න; හේන්පිටගෙදර ඤාණසීහ හිමි, විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය, 48 – 58 පිටු.

තමා විසින් කරන ලද වරද නිසා තමා කෙලෙසෙයි. තමා විසින් වරද නොකිරීම නිසා තමාම පිරිසිදු වෙයි. පිරිසිදු වීම හා අපිරිසිදු වීම යන දෙක ම තමා සතු ය. අනෙක් කෙනෙක් අනෙකෙක්ව පිරිසිදු නොකරයි.

(ධම්මපදය)